# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි අවසාන වසර (පුනර්) පරීක්ෂණය - 2018/2019

### උත්තර භාරතීය සංගීත ඉතිහාසය

### MUNI 43014

කාලය :- පැ 03

සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සමන්විත වේ.
- ❖ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
- ❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- ❖ සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ.

---

1. භාරතීය රාගධාරී සංගීතය තුල ස්ත්‍රී/ පුරුෂ භාවය විවිධ ක්ෂේත්‍රවල වැදගත් කරුණක් ලෙස සැලකේ. ඒ පිළිබඳව සැකෙවින් සඳහන් කර සංගීතයේ රාග වර්ගීකරණය කෙරෙහි මෙම ස්ත්‍රී/ පුරුෂ භාව යොදගෙන ඇති ආකාරය විස්තර කරන්න.

2. විෂයය නිර්දේශයට අනුකූලව ඔබ කැමති සංගීතඥයින් දෙදෙනෙකු පිළිඳව විස්තර ගෙනහැර දක්වන්න.

3. මූර්ච්ඡනා සිද්ධාන්තය සැකෙවින් විස්තර කරන්න. එම සිද්ධාන්තය වර්තමානයේ ප්‍රායෝගිකව භාවිතා කල හැකිද යන්න උදහරණ සහිතව පහදදෙන්න.

4. භාරතීය සංගීතයේ භාවිත “ග්‍රාම” පිළිබඳව ඔබ දන්නා කරුණු ලියන්න.

5. “ජාති ගායනය” හඳුන්වා දී එහි භේද, ප්‍රභේධ පිළිබඳව විස්තර කරන්න.

6. භාරතීය සංගීතය තුල ප්‍රසිද්ධ, අප්‍රසිද්ධ රාග විශාල ප්‍රමාණයක් ඇති අතර, ඒවායේ පරිශීලන පහසුව සඳහා විද්වතුන් විසින් ඒවා වර්ගීකරණය කල ආකාරයන් මොනවාදැයි ලියා දක්වන්න.

7. උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධති එකිනෙක මත පෝෂණය වන ආකාරයත්, ඒවා අතර ඇති සමාන ධර්මතාවන් පිළිබඳවත් විස්තර කරන්න.

8. සාම ගායනය, ගාන්ධර්ව සහ සංගීතය යන කරුණුවල වපසරිය සහ විකාසය කෙබඳු දැයි ලියා දක්වන්න.

::::::::::::::::::::::::::::::::

2021.10.11